GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

03-09-2013

## මාධ්‍ය නිවේදනය

**මව්කිරි ප්‍රවර්ධනය හා ඒ සම්බන්ධ ගැටළු**

මව්කිරි ළදරුවන්ගෙ පිවිකාවට, වර්ධනය හා සංවර්ධනයට දායකවේ. සමීක්ෂණයක් මගින් හෙළි වී ඇති ආකාරයට මව් කිරි දීමෙන් කෙටි කාලීන හා දීර්ඝකාලීනව මවටත් , ළදරුවාටත් සමාජයටත් වාසි සැලසේ . මව් කිරි දීමෙන් වැඩිහිටි අවධියේදී බෝ නොවන රෝග වලට ලක්වීමේ ප්‍රවණතාවයද අඩුවේ. ලෝක සෞඛ්‍ය සංවිධානය හා යුනිසෙෆ් ආයතනයේ නිර්දේශ වලට අනුව

01. මුල් මාස 06 තුල අනිවාර්යයෙන්ම මව්කිරි දියි යුතුය.
02. මාස 06 පිරීමේදී අමතර ආහාර හඳුන්වා දීම
03. වසර සම්පූර්ණ වන විට ගෙදර වැඩිහිටි අය ගන්නා ආහාර වේලකට හුරු කිරීම
04. වයස අවරුදු 02 දක්වා මව් කිරි දීම

ශ්‍රී ලංකාව මව් කිරි දීම ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තිය හා මාතෘ ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට මුල් වූ රටවල් අතුරෙන් එකකි. සමීක්ෂණ වලින් පෙනී යන පරිදි දරු ප්‍රසූතියෙන් පසු මුල් දින කිහිපය තුල මවට ලැබෙන සහයෝගය ( සෞඛ්‍ය සේවා මගින් හා සිය පවුල තුලින්) මව් කිරි දීම ප්‍රතිස්ථාපනය කිරීමට වැදගත්වේ. එහෙත් සදාචාර විරෝධී වෙළඳ ප්‍රචාරණ ක්‍රම මගින් මුල් වසරෙන් පසු මව් කිරි දීම අධෛර්යයට පත් කිරීමේ උත්සාහයක් පවතී.

එම නිසා අප විසින් පහත සඳහන් යෝජනා ඉදිරිපත් කර ඇත.

01. ළදරු සහ ළමා පෝෂණ වැඩ පිළිවෙලක් රටතුල ස්ථාපනය කිරීම
02. මව් කිරි දීම ප්‍රවර්ධනය පිළිබඳව සෞඛ්‍ය සේවකයන් සඳහා අනිවාර්ය පැය 40 ක මව් කිරි දීමේ උපදේශන වැඩ පිළිවෙලක් සකස් කිරීම
03. ළමා රෝග විශේෂඥ පුහුණුව ලබන්නන් හට පැය 40 ක මව් කිරි උපදේශන පාඨමාලාව හා පැය 20 ක ළදරු මිතුරු රෝහල් පාඨමාලාව අනිවාර්ය කිරීම
04. තෘතියික හා ද්විතියික රෝහල් වල මව් කිරි කලමනාකරණ ඒකක හා මව් ළදරු ඒකක ස්ථාපනය කිරීම හා කාර්ය මණ්ඩල පුහුණු කිරීම.
05. ළදරු හා ළමා පෝෂණ වැඩ පිළිවෙල සමබන්ධව පත්‍රිකා විධිමත් ව මව්වරුන් අතර බෙදා දීම.
06. හම්බන්තොට ප්‍රදේශයේ මූලික අදියරේදී සාර්ථක වූ ආකාරයේ මව් කිරි දීම හා පෝෂණය පිළිබඳ පන්ති අනෙකුත් දිස්ත්‍රික්ක වලටත් හඳුන්වා දීම.
07. අවරුදු 2ට අඩු දරුවන් උදෙසා මව් කිරි වෙනුවට දෙන ආදේශන සම්බන්ධ නීති සංශෝධනය කිරීම.

ස්තුතියි,

FDx වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516